## ශ්‍රී ලංකා

## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

## පාර්ලිමේන්තුව

---

# 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත

[සහතිකය සටහන් කළේ 1979 පෙබරවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1079 පෙබරවාරි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 25 යි.

# 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත

[සහතිකය සටහන් කළේ 1979 පෙබරවාරි මස 9 වන දින]

එල්.ඩී.—ඕ. 37/78

**බලපත්‍ර දීමේ ක්‍රමයක් හඳුන්වා දීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකුගේ ව්‍යාපාරය කර ගෙන යාම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට, නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යාම සඳහා මේ පනත යටතේ යම් උචිත බලධරයකු විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක බලය පිට හැර, කිසිම තැනැත්තකු විසින්, එසේ නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යාම නොකළ යුතු යයි අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. බලපත්‍රයක් නොමැතිව නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකුගේ ව්‍යාපාරය පවත්වා ගෙන යාම තහනම් කිරීම.

(2) සමාගමක්, සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කර ඇත්නම් හෝ ඒ යටතේ පිහිටුවනු ලැබ ලියාපදිංචි කර ඇත්නම් එවැනි සමාගමක් වන යම් සංස්ථාගත මණ්ඩලයකට මේ පනත යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3) (අ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති නියම හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා නොකරන යම් තැනැත්තකුට මේ පනත යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ආ) යම් තැනැත්තකුට මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ ද, ඒ තැනැත්තා මෙහි උපලේඛනයෙහි දක්වා ඇති නියම හා කොන්දේසි කිසිවක් කඩ කරමින් ක්‍රියා කරන්නා වූ ද අවස්ථාවක, උචිත බලධරයා විසින් නියමයක් කිරීමෙන්, ඒ නියමයෙහි සඳහන් යම් කාලසීමාවක් සඳහා ඒ බලපත්‍රය අත්හිටවනු ලැබිය හැකි ය ; නැතහොත් ඒ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(4) යම් තැනැත්තකු විසින් උචිත බලධරයාට නියමිත ගාස්තු ගෙවීම මත හැර, මේ පනත යටතේ උචිත බලධරයකු විසින් ඒ තැනැත්තාට කිසිම බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(5) ගැසට් පත්‍රයෙහි කලින් කල පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින්, මේ පනතේ කාර්යය සඳහා උචිත බලධරයකු වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිල නාමයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(6) පහත දැක්වෙන සියලුම කාරණා හෝ ඉන් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැකි හෝ ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අවස්ථා ;

(ආ) බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැක්කේ යම් තැනැත්තන්ට ද ඒ තැනැත්තන්, යම් කාලසීමාවක් සඳහා ද ඒ කාල සීමාව ;

(ඇ) බලපත්‍ර සඳහා වූ ඉල්ලීම් කළ හැකි සහ ඒ පිළිබඳව සුදුස්සක් කළ හැකි අන්දම හා ආකාරය ;

(ඈ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීම පිණිස අවශ්‍ය විය හැකි, නිෂ්පාදන තැරැව්කරුවකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයට අදාළ සියලු ප්‍රකාශ සහ ප්‍රකාශන සැපයීම ;

(ඉ) නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිති සහ ඒ ප්‍රමිති කඩ කරමින් කරනු ලබන්නා වූ ක්‍රියා හෝ නොකර හැරීම් තහනම් කිරීම.

බලපත්‍ර පවරනු ලැබිය නොහැකි බව.

3. (1) මේ පනත යටතේ යම් තැනැත්තකුට නිකුත් කරන ලද කිසිම බලපත්‍රයක් වෙනත් යම් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු අතර, ඒ අනුව, එවැනි යම් පැවරීමක් ශුන්‍ය හා බලරහිත විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් තැනැත්තකුට නිකුත් කරන ලද කිසිම බලපත්‍රයක් වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

නියමිත දිනයට පෙර නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන ගිය යම් තැනැත්තකු වෙත බලපත්‍රයක් නිකුත් කරනු නොලැබීමේ හේතුවෙන් දැරීමට සිදු වූ යම් පාඩුවක් සම්බන්ධයෙන් වන්දි නොමැති බව.

4. නියමිත දිනයට පෙර නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන ගිය කිසිම තැනැත්තකුට මේ පනත යටතේ නියමිත දිනයට පසු ඒ ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු නොලැබීමේ හේතුවෙන් ඔහුට කෙළින් ම හෝ අන් අයුරකින් හෝ ව්‍යාපාරමය වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ දැරීමට සිදු වූ යම් පාඩුවක් සම්බන්ධයෙන් වන්දි ලැබීමට ඔහු හිමිකම් නොලැබිය යුතු ය.

බලපත්‍ර අත්හිටවීම හෝ අවලංගු කිරීම.

5. (1) නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යාමට යම් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් උචිත බලධරයකු විසින් ද, ඒ ව්‍යාපාරය කරගෙන යාමට ඒ තැනැත්තා—

(අ) නිදහස නොලත් බංකොලොත්කරුවකු හෝ බුන්වත් තැනැත්තකු වීමේ ; හෝ

(ආ) චරිත දූෂණය අදාළ වන යම් වරදකට වරදකරු වීමේ ; හෝ

(ඇ) තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් තැනැත්තකු බව තීරණය කරනු ලැබීමේ නැත හොත් ප්‍රකාශ කරනු ලැබීමේ ; හෝ

(ඈ) උචිත බලධරයා විසින් දෙනු ලබන උපදෙස් නොපිළිපැදීම දිගටම කරගෙන යාමේ

හේතුවෙන් සුදුසු නොවන බව ඒ උචිත බලධරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් කරනු ලබන නියමයක් මගින්, ඒ නියම යෙහි සඳහන් යම් කාලසීමාවක් සඳහා ඒ බලපත්‍රය අත්හිටවීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තකු වෙත කරනු ලබන දැන්වීමක, ඒ දැන්වී මෙහි සඳහන් යම් කාලයක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ නියමයක් නොකළ යුත්තේ මක්නිසාදැයි හේතු දක්වන ලෙස දැනුම් දීමෙන් පසු හැර හා ඒ කාලය ඇතුළත ඔහු විසින් හේතු දැක්වීම පැහැර හරින හෝ ඔහු විසින් ප්‍රමාණවත් හේතු නොදක් වන හෝ විට හැර නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන එවැනි තැනැත්තකුට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ කිසිම නියමයක් කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා විසින්, ඒ තැනැත්තා වෙත ඒ නියමය කරනු ලැබුවේ යම් උචිත බලධරයකු විසින් ද ඒ උචිත බලධරයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඒ නියමය දන්වනු ලැබූ දින සිට දින දහයක් ඉකුත්වීමට පෙර අමාත්‍යවරයා වෙත ලිඛිත ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා විසින්, තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ යම් ආයාචන යක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී ආයාචනය කරනු ලැබුවේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කරනු ලැබිය හැකි ය.

(4) නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම සඳහා තැනැත්තකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් අත්හිටවන හෝ අවලංගු කරන (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක්, ඒ නියමය කරනු ලැබුවේ යම් උචිත බලධරයකු විසින් ද ඒ උචිත බලධරයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඒ තැනැත්තා වෙත ඒ නියමය දන්වනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයේ සිට බලාත්මක විය යුතු අතර, ඒ නියමයට විරුද්ධව අමාත්‍යවරයා වෙත ආයාචනයක් කරන ලද්දේ වුවද එය දිගට ම බලාත්මකව පැවතිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ යම් තැනැත් තකු වෙත දීමට නියම කර ඇති යම් දැන්වීමක් හෝ දැන්වීමට නියම කර ඇති යම් නියමයක් ඔහුගේ සාමාන්‍ය ව්‍යාපාර ස්ථානය වෙත හෝ පදිංචි ස්ථානය වෙත ලියා පදිංචි තැපෑලෙන් යවන ලද ලිපියකින් ඒ දැන්වීම හෝ නියමය යවනු ලැබූ දිනයට පසු ගණන් ගනු ලබන දින දෙකක කාලයක් ඉකුත්වීමෙන් පසු ඔහුට භාර දෙනු ලැබූ හෝ දන්වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) ආයාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, ඒ තීරණය, අභියාචනයක් හෝ රිට් ආඥාවක් මගින් හෝ කවර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට විධාන නිකුත් කිරීමට ඇති බලය.

6. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධාන අනුව නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන යම් තැනැත්තකු ක්‍රියා කරවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි යම් උචිත බලධරයකු කල්පනා කරන යම් විධාන ඒ උචිත බලධරයා විසින් ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් විධාන නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, එහි සඳහන් කරනු ලැබිය යුතු යම් කාලයක් ඇතුළත ඒ විධාන අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

ඇතුළුවීමේ හා පරීක්ෂා කිරීමේ බලතල.

7. මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැක්කේ යම් උචිත බලධරයකු විසින් ද ඒ උචිත බලධරයා විසින් හෝ යම් නියමිත බලධරයකු විසින්—

(අ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල හෝ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන්නේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව් කරුවකුගේ ව්‍යාපාරය කර ගෙන යනු ලබන ස්ථානයකට දවල් හෝ රාත්‍රී කාලයේ සියලු යුක්ති සහගත වේලාවන් හි දී ඇතුළුව ඒ ස්ථානය පරීක්ෂා කිරීම; සහ

(ආ) නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකුගේ ව්‍යාපාරය සම්බන්ධ යෙන් මේ පනතින් හෝ මේ පනත යටතේ තබා ගැනීමට නියමිත යම් වාර්තා සහ ඒ ව්‍යාපාරයට අදාළ වෙනත් යම් වාර්තා පරීක්ෂා කොට ඒවායේ පිටපත් ගැනීම

කරනු ලැබිය හැකි ය.

වාර්තා පවත්වා ගෙන යාම.

8. නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යන සෑම තැනැත්තකු විසින් ම නියම කරනු ලබන යම් වාර්තා පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

නියෝග.

9. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හෝ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම හා (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, යම් කාරණයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ නියෝග සෑදීමට නියමිත ද ඒ කාරණය සම්බන්ධයෙන් හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් මේ පනතින් නියෝග සෑදීමට බලය දී තිබේ ද ඒ කාරණය සම්බන්ධ යෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

*වැරදි.*

**10.** මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල යම් විධිවිධානයක් කඩ කරමින් ක්‍රියා කරන හෝ සාවද්‍ය හෝ වැරදි බව තමා දන්නා යම් විස්තර ඇතුළත් යම් වාර්තාවක්, ලිඛිත තොරතුරක් හෝ ලිඛිත පැහැදිලි කිරීමක් සපයන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

*දණ්ඩන.*

**11.** මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

*සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් විසින් කරන ලද වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් ගේ බැඳීම.*

**12.** පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, ලේකම්වරයකු හෝ ඒ හා සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, වරද කරනු ලැබූ අවස්ථාවේ දී ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල් කරුවකුව සිටි සෑම තැනැත්තකු ම

ඒ වරද තමාගේ දැනුම හෝ ගුප්තානුකූලතාව නොමැතිව සිදු කර ඇති බව සහ තමාගේ කටයුතුවල ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන තමා විසින් ක්‍රියා කළ යුතුව තිබූ පරිදි ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනහොත් මිස ඒ අධ්‍යක්ෂවරයා, සාමාන්‍යාධිකාරීවරයා, ලේකම්වරයා, වෙනත් නිලධරයා හෝ හවුල්කරු ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

*නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන් වරදකරුවන් කරනු ලැබූවිට බලපත්‍ර අවලංගු කිරීමට ඇති බලය.*

**13.** නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් වරදකරු කරනු ලබන විට ඒ වරදකරු කරනු ලැබීමට විරුද්ධව කිසිම අභියාචනයක් ඉදිරිපත්

කරනු නොලැබූ අවස්ථාවක හෝ වරදකරු කරනු ලැබීම අභියාචනයේ දී ස්ථිර කරනු ලැබූ අවස්ථාවක, යම් උචිත බලධරයකු විසින් දැන්වීමක් නොමැතිව ඒ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ ඒ තැනැත්තාගේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ ඒ බලපත්‍රය අවලංගු කිරීමට උචිත බලධරයා විසින් ගන්නා ලද තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර අභියාචනයක් හෝ රිට් ආඥාවක් මඟින් නැතහොත් වෙනත් කවර හෝ ආකාරයකින් යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ඒ පිළිබඳව ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**14.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"උචිත බලධරයා" යන්නෙන්, එය බලපත්‍රයකට අදාළ යම් පද සම්බන්ධයක දී යෙදෙන විට 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියමයකින් අමාත්‍යවරයා විසින් නමින් හෝ නිල නාමයෙන් එවැනි බලධරයකු වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අදහස් වේ ;

"බලපත්‍රය" යන්නෙන් නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම පිණිස යම් තැනැත්තකුට මේ පනත යටතේ යම් උචිත බලධරයකු විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අදහස් වේ ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරු" යන්නෙන්—

(අ) තේ, රබර් හෝ පොල් නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව් කිරීමේ ; හෝ

(ආ) පවත්නා වෙන්දේසි ක්‍රමය මගින් සහ ඒ වෙන්දේසි ක්‍රමයට බාහිර ක්‍රම මගින් තේ, රබර් සහ පොල් නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීමෙහි ලා ක්‍රියාශීලීව සහභාගි වන ;

ව්‍යාපාරයක නියුක්ත යම් පුද්ගලයෙක්, ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් අදහස් වේ.

### උපලේඛනය

#### මේ පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක නියම හා කොන්දේසි

1. නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරු, වෙන්දේසිකරුවන්ගේ සහ තැරැව්කරුවන්ගේ ආඥාපනත යටතේ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචිව සිටිය යුතු ය.

2. නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කිරීමේ වෙළෙඳාම පවත්වාගෙන යාම පිණිස, ආර්ථික ස්ථාවරත්වය නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරු විසින් දක්වා සිටිය යුතු ය.

3. ප්‍රමාණවත් ගුදම් සහ ගබඩා කිරීමේ ඉඩකඩ ඇති බවට නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරු විසින් සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

4. නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව් කිරීම කරගෙන යනු ලබන්නේ යම් ස්ථානයක ද ඒ ස්ථානය පිළිබඳ විස්තර නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරු විසින් සැපයිය යුතු ය.